# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,276 - 2022 අප්‍රේල් මස 12 වැනි අඟහරුවාදා - 2022.04.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 128 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2022 මැයි මස 06 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 අප්‍රේල් මස 19 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

දකුණු පළාත් සභාවේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ඉමදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් සෙයිනුල් ආබ්දීන් මොහමඩ් නස්ලි වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1986.02.12 වැනි දින ප්‍රදානය කර ඇති අංක ගා/ප්‍ර/7380 (එල්. එල්. 49445) දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන දෙරපෙ පදිංචි හේවගේ මුණිදාස මයා වෙත ප්‍රදානය කොට අංක 3129 පැවරුම්කරය යටතේ රනේපුර හේවගේ ජයන්ති ජිනරත්න වෙත ලබා දී ගාල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක L.D.O. 966 යටතේ 2002.12.27 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකුවීම සඳහා නීත්‍යානුකූල හිමි අයකු නොමැති වීමෙන් හෝ අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2022.05.13** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ, ඉමදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තල්පෙ පත්තුව දකුණ පත්තුවේ දෙරපෙ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දෙරපෙ නමැති ගමේ පිහිටා ඇති, සර්වේ ජනරාල් විසින් සාදනු ලැබ, අංක අ. ග. සි. 654 දරන පිඹුරේ අංක 570 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපනය කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.097 ක් ඇතැයි ගණන් බලා තිබෙන, බටපියස්ස කන්ද යනුවෙන් හඳුන්වනු ලබන පහත සඳහන් පරිදි මායිම් වූ ද රජයේ ඉඩම් කට්ටිය :-

| | | |
|---|---|---|
| *උතුරට* | : | මෙම ඉඩමේ කැබලි අංක 555 හා 571, |
| *නැගෙනහිරට* | : | මෙම ඉඩමේ කැබලි අංක 571, |
| *දකුණට* | : | මෙම ඉඩමේ කැබලි අංක 555 හා 583, |
| *බස්නාහිරට* | : | මෙම ඉඩමේ කැබලි අංක 555. |

එස්. ඒ. එම්. නස්ලි,
ප්‍රාදේශීය ලේකම්,
ඉමදූව.

2022 ජූලි මස 27 වැනි දින.

04-354